# සිනාව මැද පලා ගිය අමනුෂ්‍යයා



බල්ලන්, වඳුරන්, රිළවුන් වැනි සත්වයන්ගේ මුහුණු වල ඇතැම් විට සිනහවක් දක්නට ලැබේ. මොවුන් මෙයින් ප්‍රකට කරන්නේ ඒ අවස්ථාවේ උන්ගේ සිතෙහි ජනිත වන ප්‍රසන්නතාවයි. මිනිසුන්ද මෙසේ ප්‍රසන්නතාව හේතුවෙන් සිනහව පෙන්වයි. එයට අමතරව යථාර්ථයට නොගැළපෙන සමහර දේ දැකීමෙන් ඇසීමෙන් හෝ සිතීමෙන්ද මිනිසාට සිනහව ඇතිවෙයි. මැද මොළයේ ඇතිවන එක්තරා උත්තේජනයක් හේතුවෙන් මෙම සිනහව පහළ වන අතර රසායනිකව බාහිරින් මෙම උත්තේජනය ලබා දීමෙන්ද කිසිම කරුණකින් තොරව මිනිසෙක් සිනහ ගැන්විය හැක.

ගුණසීලි මැණිකේ යනු වික්‍රමසිංහ ආරච්චිලගේ එකම දියණියයි. තරමක් රූමත් වූ ඇය ගමේ ඉතා විනෝදයෙන් කාලය ගතකළාය. ඇයගේ වයස අවුරුදු විස්සක් පමණ විය. කෝරාළ මහතාගේ පුතා වූ හේමප්‍රිය හාමු ඇයට හමුවන්නේ මීට වසර දෙකකට පමණ පෙර කෝරාළ මහතා සමඟ ඇගේ නිවසට පැමිණි අවස්ථාවේය. හේමප්‍රිය හාමු අවුරුදු විසි දෙකක් පමණ වූ කඩවසම් තරුණයෙකි. දුටුවන්ගේ සිත් ඇදගන්නා මනා රූප කායක් ඔහුට විය. ඉන් පසු කිහිප වතාවක් ඇයට හේමප්‍රිය හාමු විවිධ ස්ථානවලදී හමුවී ඇත.

ගමේ අවුරුදු උත්සවයක් පැවැත්වීමට ගුණසීලි මැණිකේ කල්පනා කළාය. මෙහි තරග විනිශ්චය සඳහා හේමප්‍රිය හාමුටත් ත්‍යාග ප්‍රදානය සඳහා කෝරාළ මහතාටත් ආරාධනා කළ යුතු යෑයි ඇය තීරණය කළාය. ගමේ තරුණ තරුණියන් හා එක්ව මනරම් අවුරුදු උළෙලක් සංවිධානය කළ ඇය කෝරාළ මහතාට හා හේමප්‍රිය හාමුට ආරාධනය කිරීම තම පියාට භාර දුන්නාය. අවුරුදු උත්සව දිනය එළැඹිණි. තරග සංවිධානය ගුණසීලි මැණිකේ කළ අතර එය විටින් විට හේමප්‍රිය හාමුගේ පැසසුමට ලක්විය. කෝරාළ මහතාට හා හේමප්‍රිය හාමුට දිවා ආහාරය සූදානම් කොට තිබුණේ ආරච්චි වලව්වෙනි. එම අවස්ථාවේ ගුණසීලි මැණිකේටත් තමා අසලින් වාඩි වී ආහාර භෝජනය කරන මෙන් හේමප්‍රිය හාමු ඉල්ලා සිටියේය. තරඟ කටයුතු පිළිබඳව ආරච්චි වලව්වේදී දෙදෙනා සාකච්ඡා කළහ. ගුණසීලි මැණිකේගේ සිත ඉතා ප්‍රීතිමත් සහ මින් පෙර අත් නොවිඳි අමුතුම ආකාරයේ හැඟීමකින් පිරී ගියේය. අවසානයේදී තිබුණේ අවුරුදු කුමරිය තේරීමේ තරගයයි. මේ සඳහා ගමේ රූමත් තරුණියන් කිහිප පළක්ම ඉදිරිපත් වී තිබුණි. මේ අතරින් වඩාත්ම රූමත් තැනැත්තිය හේමප්‍රිය හාමු විසින් තෝරා ගන්නා ලද්දේය. ඇයට ඔටුන්න පැළැන්ද වූ හේමප්‍රිය හාමු ඇගේ අතින් අල්ලාගෙන බොහෝ වේලා කතා කළ අතර අවසානයේ ඇයට හාදුවක්ද පිරිනමන ලදී. මේ සියල්ල දෙස ඉතා අපහසුවෙන් බලා සිටි ගුණසීලි මැණිකේගේ සිතට මහත් තෝන්තුවක් දැනිණ.

අවුරුදු උත්සව දිනයෙන් පසුව වැඩි කතාබහක් නැතිව බලාගත්ත දිහා බලාගෙන කාමරය ඇතුළටම වී සිටින තම දියණියට යම් අසනීපයක් වැළඳී ඇත්දැයි ආරච්චිල සෝදිසි කළේය. ,මට කිසි ලෙඩක් නැහැ, යෑයි සැරෙන් කිවූ දියණිය අහක බලාගත් විලාසය දුටු ආරච්චිලට මහත් බියක් ඇතිවිය. අවුරුදු උත්සව දිනයේ හා ඊට පෙර ගමේ වෙල් ඉපනැල්ලේ දිවගොස් අමනුෂ්‍ය දෝෂයක් හටගන්නට ඇතැයි ද ඔහුට සිතිණි. ඔහු පසු දිනම ගොස් ඉතා දක්ෂ යකැදුරෙකු වන වග්ගුපාල යකැදුරු තැන කැඳවා ගෙන ආවේය. දියණිය සමඟ තනිවම කතා කිරීමට අවශ්‍ය බැව් පැවසූ වග්ගුපාලට ඒ සඳහා අවකාශ ලැබිණ.

තම කාමරයට පැමිණි වග්ගුපාල හා කතා කිරීමට ගුණසීලි මැණිකේ මනාපයක් දැක්වූයේ නැත. එහෙත් වග්ගුපාලගේ දක්ෂතාව උඩ ඇය ක්‍රමයෙන් නම්මා ගැනීමට වග්ගුපාලට හැකිවිය. ගුණසීලි මැණිකේ සමඟ කතාබහෙන් පසුව වග්ගුපාලට තේරුම් ගියේ ගුණසීලි මැණිකේගේ හිතේ හේමප්‍රිය හාමු පිළිබඳව ආදර හැඟීමක් ඇතිවී තිබෙන බවත් අවුරුදු කුමාරිය තෝරන අවස්ථාවේ සිදුවූ දෙයින් ඇය මානසික කම්පනයකට ලක්ව ඇති බවත්ය.

සතියක් ඇතුළත මැය සනීප කර දෙන බවට ආරච්චිල සමඟ පැවසූ වග්ගුපාල ඇයට අමනුෂ්‍ය දෝෂයක් වැළඳී ඇතැයි ද එම අමනුෂ්‍යයා ඇගේ ශරීරයෙන් ඉවත් කර දීමට තමා කටයුතු කරන අතර මේ ගැන ලෙඩාට හෝ වෙනත් කිසිවකුට නොපවසන ලෙසද පවසා යන්නට ගියේය.

පසු දින හේමප්‍රිය හාමු හමුවුණ වග්ගුපාල මෙම සිද්ධිය ඔහුට පැහැදිලි කර ඇයට ආදරය කිරීමට හැකියාවක් ඇත්දැයි ඇසීය. මේ කතාබහත් සමඟ ඇයත් සමඟ තරමක ආශ්‍රයක් තිබුණ හේමප්‍රියගේ සිතටද ගුණසීලි මැණිකේ පිළිබඳ එවන් හැඟීමක් මෝදු වන්නට පටන් ගත්තේය. දින දෙකකට පසුව ගුණසීලි මැණිකේ හමුවන ලෙස හේමප්‍රිය හාමුට කී වග්ගුපාල එතැනින් සමුගත්තේ තමාගේ ක්‍රියාකාරකම් මැනවින් එලදැරූ බවට සිතමින්ය.

දින දෙකකට පසුව උදැසන ආරච්චි මහතා හමුවට පැමිණි වග්ගුපාල යකැදුරා ගුණසීලි මැණිකේගේ සිරුරට අරක්ගත් අමනුෂ්‍යයා එළවා දැමීමට සූදානම් විය. ඇගේ කාමරයට ගිය වග්ගුපාල බෙහෙත් තෙල් වර්ග මිශ්‍ර කරමින් ඒවා රත්කරමින් එහි වාෂ්ප ගුණසීලි මැණිකේගේ මුහුණට වදින්නට සැලැස්වීය.

පවුලේ සියලු දෙනා මවිත කරමින් එතෙක් බුම්මාගෙන සිටි ගුණසීලි මැණිකේ සිනා වෙන්නට පටන් ගත්තේය. ඉන්පසු පවුලේ අයට කාමරයෙන් පිටතට යන ලෙස කී වග්ගුපාල තමා හේමප්‍රිය හාමු මුණගැසීමට ගිය බවත් ඔහුද ගුණසීලි මැණිකේට ආදරය කරන බවත් අවුරුදු කුමාරිය හා හැසිරුණ ආකාරය නගරයේ පාසල් ගිය හේමප්‍රිය හාමු වැනි අයට එතරම් විශේෂත්වයක් නොවන බවත් එහෙත් එවැනි දේවල් නොකරන ලෙස පැහැදිලි කර දිය හැකි බවත් ගුණසීලි මැණිකේ සමඟ පැවසීය. තවද අද හවස ගුණසීලි මැණිකේ බැලීමට හේමප්‍රිය හාමු පැමිණෙන බවද වග්ගුපාල කීය. වහා ඇඳෙන් නැගිට ගත් ගුණසීලි මැණිකේ නාගැනීම සඳහා ළිඳ වෙත දිව ගියාය. තමාගේ කටයුතුවලට විශාල මුදලක් අය කළ වග්ගුපාල යකැදුරා කාගේත් විශ්වාසය වැඩිදියුණු කරගෙන වලව්වෙන් පිටවිය.

නයිට්‍රස් ඔක්සයිඩ් වායුව කෙනෙකුට ආඝ්‍රාණය වුණ විට ඉබේටම සිනහව ඇතිවේ. මෙය සිනහ වායුව යනුවෙන්ද හඳුන්වනු ලබයි. ඇතැම් අවස්ථාවලදී වෛද්‍යමය කරුණු සඳහා මෙය නිර්වින්දනයක් ලෙසද භාවිත කරනු ලැබේ. සමහරක් අයට මින් යම් අසාත්මිකතාවන් ද හට ගනී.

**චිත්‍රාන් මොරකන්දෙ ගමගේ**

රුධිර දාන මාසයයි
2019 අප්‍රේල් 19 සිට 2019 මැයි 19 දක්වා.
Blood Donation
ලේ බිඳක් දන් දී ජීවිතයක් රැකගමු.
ජේසුස් නම් වූ මනුෂ්‍ය පුත්‍රයා, මනුෂ්‍යය වර්ගයා සුවපත් කරනු පිණිස කුරුසිය මත ලේ හැලූ මහා සිකුරාදා දින සිට ආරම්භකර "සියලු සත්වයන් නිදුක් වෙත්වා ,නිරෝගී වෙත්වා ,සුවපත් වෙත්වා" යන ප්‍රාර්ථනය ලොවට කියාදුන් බුද්ධ පුත්‍රයන්ගේ තෙමගුල සිහිකරන වෙසක් මංගල්‍යය දිනෙන් අවසන් කරන්නට යෙදෙන **Melbourne Lankan Youth** සංවිධානය නම් කල "රුධිර දාන මාසය" සමග එක් වී මනුෂ්‍යය ජීවිතයක් බේරා ගන්න එකතු වෙන්න .
Call for Information Naveen: 0415594646